සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය

නිවිතිගල අධ්‍යාපන කලාපය (සැකසුම -ඩබ්ලිව් .සී.සමරසිංහ )

අප්‍රේල් මාසය - 2 සතිය පුනරීක්ෂණ අභ්‍යාස 2

1)යා කරන්න

| | | |
|---|---|---|
| 1.ඔළුව ඉදිමීම | නම්බුව නැති ව ගියා | |
| 2.නා කපන වැස්ස | දැඩි නිහඬබව | |
| 3.ඉස්පාසුවක් | ඉතා තද වැස්ස | |
| 4.සායම ගියා | අහංකාර වීම | |
| 5.මීයට පිම්බා වගේ | විවේකයක් | (2×5) |

2)ඉරි ඇඳි පදවල විරුද්ධාර්ථ පදය යොදා මෙම වාක්‍ය නැවත ලියන්න

1.<u>අපිරිසිදු</u> පරිසරය මනසට සුවදායක ය. 2.<u>දුසිරිත්</u> වඩමු. 3.<u>වංක</u> මිතුරන් ඇසුරු කරමු.

4.පිරිසිදු චේතනා ගෙන දෙයි <u>අවාසනා</u>

5.<u>විදේශීය</u> දේ අගයමු. (4×5)

3)නිවැරදි යුගල පද ලැබෙන සේ යා කරන්න

| | | |
|---|---|---|
| *හැරමිටි | පාඩු | |
| *ගොඩ | මනන් | |
| *අනන් | කියන | |
| *කරන | මඩ | |
| *අඩු | බැරමිටි | (2×5) |

4)මෙම වැකිවල සත්‍යාසත්‍යභාවය වරහන් තුළ සටහන් කරන්න

1.තනි ව උච්චාරණය කළ හැක්කේ ව්‍යඤ්ජන අක්ෂරයි (.........)

2.සිංහල අක්ෂර මාලාවේ අක්ෂර 60ක් ඇත. (..........)

3) ස්+උ= සි (.........)

4. ‘ග’ යනු තල්ලෙන් උපදින අක්ෂරයකි. (............)

5.මල යන්නෙහි ‘ම’ යනු ඕෂ්ඨජ අක්ෂරයකි. (.........) (4×5)

5)පිළිතුරු සපයන්න

1.බොහෝ ඇසූපිරූ තැනැත්තා හඳුන්වන නම කුමක්ද?

2.චිරන්තන සාහිත්‍ය ග්‍රන්ථ 3ක් නම් කරන්න

3.ජාතිකාභිමානී හැඟීම් උපදවන කවි ලියූ කතුවරුන් තිදෙනෙක් නම් කරන්න.

4.පවර් පොයින්ට් රූප රාමු සැකසීමේ දී සැළකිලිමත් විය යුතු කරුණු 3ක් ලියන්න

5.සාහිත්‍යයේ ප්‍රධාන ප්‍රබේද 3 නම් කරන්න. (4×5)

6) මා සුළඟක් වුවහොත් යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න (20)